# ගණිතය කාර්ය පත්‍රිකාව

10 - ශ්‍රේණිය    ගණිතය    සැප්තැම්බර් 3 වැනි සතිය

දත්ත නිරූපණය, සංඛ්‍යා ව්‍යාප්ති    තේමාව - සංඛ්‍යානය

---

මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබාගත යුතු ඉගෙනුම් ඵල .

දී ඇති දත්ත ඇසුරෙන් වට ප්‍රස්තාර ඇඳීමට,
වට ප්‍රස්තාර ඇසුරෙන් තොරතුරු ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.
සමූහිත දත්තවල මධ්‍යන්‍යය සෙවීමට හැකියාව ලැබෙනු ඇත.

ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් කෙටියෙන්

- පෙර ඉගෙනුම් පත්‍රිකාවල ඇති ක්‍රියාකාරම්වල නිරත වන්න.
- ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකාවේ තීර ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න.
- ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකාවේ 'ආ' කොටස හා සම්බන්ධ අභ්‍යාසය සම්පූර්ණ කරන්න.
- පෙළ පොත i කොටසේ 123 පිටුවේ 11.1 අභ්‍යාසයට පිළිතුරු ලියන්න.
- ස්වයං අධ්‍යයන කාර්යපත්‍රිකාවේ වට ප්‍රස්තාර නිදසුන් අධ්‍යයනය කරමින් ඉගෙනගන්න.
- පෙළ පොත i කොටසේ 126 පිටුවේ 11.2 අභ්‍යාසයට පිළිතුරු ලියන්න.
- ඔබ උගත් කරුණු තහවුරු කර ගැනීම සඳහා පෙළපොතේ 127 වැනි පිටුවේ මිශ්‍ර අභ්‍යාසයට පිළිතුරු සපයන්න.
- සාමූහිත දත්ත පෙර ඉගෙනුම් පත්‍රිකාවල ඇති ක්‍රියාකාරම්වල නිරත වන්න.
- සමූහිත දත්තවල මධ්‍යන්‍යය ගණනය කිරීමේ නිදසුන අධ්‍යයනය කරන්න.
- පෙළ පොත ii කොටසේ 89 පිටුවේ 26.1 හා 92 පිටුවේ 26.2 අභ්‍යාසයට පිළිතුරු ලියන්න.
- පෙළ පොතේ 93 පිටුවේ නිදසුන - 1 අධ්‍යයනය කර උපකල්පිත මධ්‍යන්‍යය ඇසුරින් මධ්‍යන්‍යය සොයන ආකාරය ඉගෙන ගන්න.
- පෙළපොතේ 95 පිටුවේ 26.3 අභ්‍යාසයට පිළිතුරු ලියන්න.
- පෙළ පොතේ 70 වැනි පිටුවේ 6.2 අභ්‍යාසයට පිළිතුරු ලියන්න.
- පසුපිටේ ඔබට දී ඇති ඒකක පරීක්ෂණයට පිළිතුරු සපයන්න.
- e තක්සලාව, e නැණ පියස, ගුරු ගෙදර, youtube නාලිකා, පාසල් ශිෂ්‍ය සමූහ (Whatsapp, Viber, …) Google class room, online ඉගෙනුම්, පාසල් වෙබ් අඩවි, පෙළ පොත හෝ මුද්‍රිත පොත් පත් ආදී ඉගෙනුම් ආධාරක මඟින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.

ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්, Website, LMS පාඩම්, වෙනත් ආධාරක

- 10 – 1 ගණිතය පෙළ පොත (පිටු අංක 176 - 185)
- ගණිතය පහසුවෙන් - **සංඛ්‍යානය** - ජාතික අධ්‍යාපන ආයතනය (පිටු අංක 11 - 20)
- 'ගණිත ශූරයා' ELC ග්‍රන්ථය - ගණිත ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය (පිටු අංක 339 - 347)
- 'සතුටින් ගණිතය' සබරගමු පළාත් 10 ශ්‍රේණිය *Telegram* සිසු සමූහය
    - *https://t.me/joinchat/e7B47qD7E-Q3ZDI1*
- e නැණ පියස වෙබ් අඩවිය - සබරගමු පළාත, සතුටින් ගණිතය ඉගෙනුම් ගොනුව (PDF),
    - පෙර ඉගෙනුම් කාර්ය පත්‍රිකා/ ස්වයං අධ්‍යයන කට්ටලය/ ඒකක පරීක්ෂණය
    - https://www.enenapiyasa.lk/lms/course/view.php?id=108#section-10
    - https://www.enenapiyasa.lk/lms/course/view.php?id=108#section-25
- Narrative video, YouTube video, interactive activates, unit test
    - e - තක්සලාව LMS
    - *https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=537&section=29*
    - ගුරුගෙදර නාලිකාව - *https://youtu.be/QJkbEdm2oEs*

# ඒකක පරීක්ෂණය

## <u>දත්ත නිරූපනය හා සංඛ්‍යා ව්‍යාප්ති</u>

1. සුළු කරන්න.

   i. $\frac{25}{50} \times 360$  ii. $\frac{360}{720} \times 15$  iii. $360 \times \frac{10}{90}$

2. 10 ශ්‍රේණියේ සිසුන් පිරිසක් තෝරාගත් කාණ්ඩ විෂයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| විෂය | සිසුන් ගණන |
|---|---|
| සිංහල රසාස්වාදය | 15 |
| චිත්‍ර | 30 |
| නැටුම් | 20 |
| සංගීතය | 25 |

   i. වට ප්‍රස්තාරය ඇඳීමට එක් එක් විෂය සඳහා සිසුන් දැක්වෙන කේන්ද්‍රික කෝණය ගණනය කරන්න. ඒ ඇසුරෙන් වට ප්‍රස්තාරය අඳින්න.

3. වසර 4ක් තුළ එක්තරා පාසලක ශිෂ්‍යත්ව විභාගය සමත් සිසුන් පිළිබඳ තොරතුරු පහත වට ප්‍රස්තාරයේ දැක්වේ.




   i. $x$ හි අගය සොයන්න.

   ii. 2016 තුළ සමත් සිසුන් සංඛ්‍යාව 180 නම් එක් එක් වසර වලදී සමත් සිසුන් සංඛ්‍යාව වෙන වෙනම සොයන්න.

4. තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයකට දළු සපයන්නන් 45 දෙනෙකු දිනක දී සපයනු ලැබූ තේ දළු ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත සංඛ්‍යාත ව්‍යාප්තියේ දැක්වේ.

| ස්කන්ධය(kg) | 15-20 | 20-25 | 30-35 | 35-40 | 40-45 |
|---|---|---|---|---|---|
| සපයන්නන් ගණන | 3 | 7 | 12 | 15 | 8 |

   i. තේ දළු සපයන්නන් විසින් දිනකදී එම මධ්‍යස්ථානයට සපයන ලද දළු ප්‍රමාණයේ මධ්‍යන්‍යය ගණනය කරන්න.

   ii. මේ අනුව ඉදිරි දින 30 කදී එම මධ්‍යස්ථානයට ගෙන එතැයි බලාපොරොත්තු වියහැකි තේ දළු ප්‍රමාණය කොපමණ ද.

   iii. උපකල්පිත මධ්‍යන්‍යය ලෙස මාත පන්තියේ මධ්‍ය අගය යොදා ගනිමින් තේ දළු සපයන්නන් විසින් දිනකදී එම මධ්‍යස්ථානයට සපයන ලද දළු ප්‍රමාණයේ මධ්‍යන්‍යය ගණනය කරන්න.

   iv. ඉහත i හා iii මගින් ලැබෙන පිළිතුරු පිළිබඳ ඔබේ අදහස දක්වන්න.

*නිළධාරියාගේ නම - W.T.S.J. ගුරුගෙදර*  *පාසල - කෑ/දෙල්ඔළුව ක වි*